අයදුම්පත් කැඳවීමේ නිවේදනය

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා විදේශ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.

2016 දෙසැම්බර් මස 06 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10.3 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ශ්‍රී ලංකා විදේශ සේවයේ විශේෂ ශ්‍රේණිය සඳහා අනුමත තනතුරු සංඛ්‍යාවෙන්, 2023 ඔක්තෝබර් මස 25 වැනි දිනට පවතින පහත සඳහන් පුරප්පාඩු 15ක් පිරවීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (කෙසේ වුවද අයදුම්පත් කැඳවීමේ අවසන් දින තෙක් ඇති වන පුරප්පාඩු ද මෙම සම්මුඛ පරීක්ෂණය මඟින් පිරවීමට කටයුතු කරනු ලැබේ. ඒ පිළිබඳ අයදුම්කරුවන් දැනුවත් කෙරේ.)

2. මේ අනුව ශ්‍රී ලංකා විදේශ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා සුදුසුකම්ලත් නිලධාරීන් අතරින් ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්(03) ගුණයකට නොවැඩි නිලධාරීන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට මෙමඟින් කටයුතු කරනු ලැබේ.

| විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු ඇති වූ දින | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| 2020.01.04 | 1 |
| 2020.02.04 | 1 |
| 2020.02.11 | 1 |
| 2020.03.17 | 1 |
| 2020.06.09 | 1 |
| 2020.08.18 | 1 |
| 2020.11.16 | 1 |
| 2020.12.07 | 1 |
| 2021.03.02 | 1 |
| 2021.09.02 | 1 |
| 2021.09.27 | 1 |
| 2022.04.02 | 1 |
| 2023.01.01 | 1 |
| 2023.08.10 | 1 |
| 2023.10.25 | 1 |
| එකතුව | 15 |

3. ශ්‍රී ලංකා විදේශ සේවයේ I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්

අ. යෝග්‍යතා නිර්ණායක (ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාවේ 10.3.1 අනු වගන්තිය අනුව)

i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයෙහි (2020 ජූලි මස 29 වැනි දිනැති අමාත්‍යාංශ උපදෙස් මාලා අංක 221 අනුව) පශ්චාත් උපාධියක් ලබා තිබීම.

ii. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට ශ්‍රී ලංකා විදේශ සේවයේ I ශ්‍රේණියේ වසර පහක(5) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා I ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහක්(5) උපයාගෙන තිබීම.

iii. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට සේවයේ වසර දහඅට(18)කට නොඅඩු සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iv. උසස්කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ(5) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.

v. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

**4. උසස් කිරීමේ ක්‍රමය**

ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාවේ 10.3.2 අනු වගන්තිය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත පදනම්ව උසස් කිරීම් සිදු කරන බැවින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයන් 5 දෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් කරනු ලබන සම්මුඛ පරීක්ෂණයකින් පසුව සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය මත විශේෂ ශ්‍රේණියට පත් කිරීම සඳහා වන නිර්දේශයන් ඉදිරිපත් කරන අතර, ඒ සඳහා අයදුම්පත් කැඳවීමේ අවසන් දින දක්වා පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයකට නොවැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

4.2 සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල මත පදනම්ව එක් එක් පුරප්පාඩු දිනයන්ට විශේෂ ශ්‍රේණි උසස්වීම් අදාළ මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට පුරප්පාඩු දිනයේ සිට බලාත්මක වන පරිදි උසස්වීම් ලබා දෙනු ඇත. තව ද මූලික සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට අදාළ ජ්‍යෙෂ්ඨතා ලේඛන එදිනට සුදුසුකම් ලැබූ නිලධාරීන් උසස්වීමට පෙර පැවති ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව සැකසේ.

5. අයදුම්පත් කැඳවීමේ අවසන් දින දක්වා ශ්‍රී ලංකා විදේශ සේවයේ පවතින පුරප්පාඩු සඳහා උසස්වීම් කරනු ලබන බැවින් ඉහත 2 ඡේදයේ සඳහන් පුරප්පාඩු දිනවලට සුදුසුකම් සපුරන නිලධාරීන් මේ සමඟ වන ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් විදේශ කටයුතු ලේකම් වෙත 2024.04.10 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් හෝ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාල මගින් විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලියකියවිලි එවනු ලබන ක්‍රමවේදය අනුගමනය කරමින් හෝ භාර දිය යුතුය. එදිනට පසුව එවනු ලබන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලබන අතර සදොස්ව හා අසම්පූර්ණව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ඉහත මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් පමණක් අයදුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස දන්වනු ලබන අතර, දැනට විශ්‍රාම ගෙන සිටියේ වුවද ඉහත 2 ඡේදයේ සඳහන් පුරප්පාඩු දිනයන්ට උසස්වීම් ලැබීමට සුදුසුකම් ලබන, එකී දිනයන්ට සේවයේ යෙදී සිටි, උසස්වීමට ඉහත 3 ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරන ලද නිලධාරීන් හට ද මෙම උසස්වීම් සඳහා ඉල්ලුම් කළ හැකි ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

අරුණි විජේවර්ධන
ලේකම්
විදේශ කටයුතු අමාත්‍යාංශය.

2024 මාර්තු මස ....04